පාඨක පන්හිඳෙන්

සංස්කාරක මණ්ඩලයේ ආරාධනය පිළිගෙන අප පාඨකයන් බොහෝ දෙනෙකු විසින් විවිධ විශේෂාංග, ලිපි අප වෙත එවා තිබේ. එම ලිපිවලින් පළමු වැන්න මේ සමග පළවේ. අනෙක් ලිපි ඉදිරි කලාපවල පළවෙනු ඇත. මෙබඳු විශේෂාංග තව තවත් සපයන ලෙස සංස්කාරක මණ්ඩලය ආරාධනා කර සිටී.

# පැණි වලින් කඳුළු මතුවන කවි

## ජීවන සුවඳ විහිදුවන මී කවි

රසවත් බවට උපමාවක් සැප යීමට තරම් මී පැණි රසවත්ය. එහෙත් මී පැණි ලබාගැනීමට යන ගමන එතරම් රසවත් නොවේ. මී මැස්සන්ගෙන් පහර වදින බැවිනි. එහෙත් ඒ දුෂ්කර කර්තව්‍ය වුවද අපේ පැරන්නෝ රසවත් කර ගත්හ. ඒ එයට කවිය එකතු කිරීමෙනි. දූන් දූන් අභාවයට යන එබඳු මී කවි කිහිපයකි මේ.

සොහොයුරන් දෙදෙනෙකුගේ ගැටුමක් ගැන කියවෙන රසවත් කවි කීපයක් මී කවි වල එයි. එක ගෙදරක සොහොයුරන් දෙදෙනෙක් වාසය කළෝය. වැඩිමහල් සහෝදරයාගේ බිරිඳ සමග බාලයා අනියම් ප්‍රේම සම්බන්ධයක් පැවැත් විය. මේ බව දැනගත් වැඩිමහලු සොහොයුරා බාලයාගෙන් පලිගැනීමට සිතා, ඔහුත් සමග බඹර කැපීමට යැමට සූදනම් විය. පලිගැනීම ගැන දැනගත් ඔවුන්ගේ මෑණියන් ගමන නවතා ලීමට තමාට පෙනුන බොරු සිහිනයක් ගැන කීවාය. ඒ අනිෂ්ට සිහිනය මෙසේය.

උඩුමාලේ මල් වැසි
වසිනව දුටුම්
බිම්මාලේ ලේ වැසි
වසිනව දුටුම්
ලිප ලිග්ගල් තුන තනි
වෙනවා දුටුම්
නාගස බඹරු කැපුමට
යනවා දුටුම්

මව ඔවුනගේ ගමන නැවැත්වීමට කටයුතු කළ නමුත් එය නොඅසා දෙසොහොයුරෝ බඹරු කැපුමට ගියහ. මලයා ගසට නැග බඹර කපන විට අයියා ගසෙහි බැඳි හැර කපා යන්නට ගියේය. කෝප වුන බඹරු මලයාට අනින්ට වූයෙන්, වේදනා වෙන් පෙළුන ඔහු මෙසේ විලාප කීය.

'කුසේ උපන් ලොකු
අයියා කල අයුතී
ගසේ ඉද්දි යට හැරපට
කපා යතී'
බඹරු සිය දහස් ගත
ලේ උරා බොතී
පලයන් අයියන්ඩි මා
එන ගමන් නැතී''

බිරිඳ කියනා වදන් නොඅසා මී පැණි එකතු කිරීමට පිරිසක් සමග වනයට ගිය, තම සැමියා වලසෙකුට අසුව ආපසු නා වේදනාවෙන් බිරිඳ මෙසේ කීවාය.

''රුබර මගෙ හිමියා ඇයි
තව නැත්තේ
වලසෙක් ඇවිත්
කැවාදෝ තව නැත්තේ
ගෙන්නා ගන ගියා
ඇයෝ තව නැත්තේ
හිමි නැතිනම් මගෙ
පන දෙම් උන් මත්තේ

මී ඇදීමේ අදහසින් වනයට වැදුන වන්නියේ ගැමියෝ මී ලැබීමට කවි ගායනා කළෝය. එයින් මී පැණි ලැබෙනු ඇතැයි ඔවුන් විශ්වාස කළහ.

''වනන්තරේ ගස්වල
මල් පිපෙන්නේ
නිරන්තරේ ඇවිදින් මල්
ගෙන යන්නේ
සිටින තැන තමයි
රස පැණි බඳින්නේ
බඹරු තමයි අපටත්
පැණි දෙවන්නේ

එනවා කියන්නම් හෙට
කොටු අරවන් ඩ
ලී වැල් ගෙනෙන් නම්
හැර පොට බඳින් ඩ
බඹරු අඬන්නේ තව
රොන් ගෙනයන් ඩ
ඉඩ හැරපියව් තොප දිවි
ගලවා ගන් ඩ

මී පැණි එකතු කරන ගැමියෝ වනයට ගොස් ලබන වසරෙත් පැණි ලැබෙන්නට කියා, වනයෙන් ගෙදර එන ගමන් කවි ගායනා කරති.

'සැම දෙවියන්හට
සැලකර කියඤ්ඤයි
සැම දෙවිඳුන් ගෙන්
විවරණ ලබඤ්ඤයි
සැම දෙවිඳුන් ගෙන්
ඉටිපැන් ලබඤ්ඤයි
සැම දෙවියන් ගෙන්
අදමා බිම බසිඤ්ඤයි

අහසේ ගොසින් තරුයට
සැඟවුනත් වරෙන්
පොලවේ ගොසින් වැලි
යට සැඟවුනත් වරෙන්
මූදේ ගොසින් දිය යට
සැඟවුනත් වරෙන්
මල් බඹරිඳු කොයි
රටකට ගියත් වරෙන්

හඳුන් මලින් රොන්
ගන්නට යන්නේ
හඳුන් මලේ රොන්
ගන්නට නොදෙන්නේ
කෝන රජාහට
මල් දක් වන්නේ
හත් දවසක් මල්
මුර දක් වන්නේ''

මෙයට අමතරව තවත් මී කවි රාශියක් ඇත්තේය. ඒවා ගායනා කර ජනතාව අදත් රස විඳිති. මීයෙන් උපන් මෙම ජනකවිවලින් පැණි රස බේරෙයි. ජීවන සුවඳ විහිදෙයි.

**ජයතිලක හේරත්**
**ලියති.**